# 2016

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

## Annual Performance Report

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
**Ministry of Internal Affairs,
Wayamba Development and Cultural Affairs**
உள்ளக அலுவல்கள், வடமேல் மாகாண மற்றும்
கலாச்சார அலுவல்கள் அமைச்சு




ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
தேசிய நூதனசாலைகள் திணைக்களம்
DEPARTMENT OF NATIONAL MUSEUMS

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා

සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

# ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

# කාර්ය සාධන වාර්තාව - 2016

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

කොළඹ - 07

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව**

## දැක්ම

සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා ජාතික උරුමය සංරක්ෂණය, ප්‍රවර්ධනය සහ ප්‍රචාරණය කිරීම

## මෙහෙවර

සංස්කෘතික හා ස්වභාවික උරුමයට අයත් සම්පත් විද්‍යාත්මකව හා ක්‍රමානුකූලව ආරක්ෂා කිරීම හා මහජනතාවගේ ඇගයීම, අධ්‍යාපනය සහ රසාස්වාදය උදෙසා ඉදිරිපත් කිරීම.

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ | - | 011-2695366 |
| ෆැක්ස් අංකය | - | 011-2692092 |
| පොදු දුරකථන අංකය | - | 011-2694767 |
| ඊමේල් ලිපිනය | - | nmdep@slt.lk |
| වෙබ් ලිපිනය | - | www.musuem.gov.lk |

# පටුන

පිටු අංකය


1. හැඳින්වීම 01

2. මූල්‍ය ප්‍රතිපාදන 02 - 03

3. ආයතනික කටයුතු 04 - 07

4. 2016 වර්ෂයේ කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්යයන් 08

5. කෞතුකාගාර නරඹන්නන් පිළිබඳ විස්තර 09

6. විවිධ විෂයානුබද්ධ අංශවල කටයුතු

6.(අ) සංස්කෘතික අංශය 10 - 14

6.(අ).1 මානවවංශ විද්‍යා අංශය

6.(අ).2 මානව විද්‍යා අංශය

6.(ආ) විද්‍යාත්මක අංශය 15 - 22

6.(ආ).1 උද්භිද විද්‍යා අංශය

6.(ආ).2 කීට විද්‍යා අංශය

6.(ආ).3 භූ විද්‍යා අංශය

6.(ආ).4 සත්ත්ව විද්‍යා අංශය

7. අධ්‍යාපන ප්‍රකාශන අංශය 23

8. ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරය 24

9. ජාතික කෞතුකාගාර පුස්තකාලය 24

10. ඡායාරූප අංශය 24

11. සංරක්ෂණ අංශය 25 - 28

12. ප්‍රදර්ශන සැලසුම් අංශය 28

13. තොරතුරු තාක්ෂණ අංශය 28 - 29

14. කෞතුකාගාර කටයුතු 29 - 31

14.(අ) කොළඹ ජාතික කෞතුකාගාරය

14.(ආ) ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය

14.(ඇ) මහනුවර ජාතික කෞතුකාගාරය

14.(ඈ) ඕලන්ද කෞතුකාගාරය

14.(ඉ) රත්නපුර ජාතික කෞතුකාගාරය

14.(ඊ) අනුරාධපුර ජන කෞතුකාගාරය

14.(උ) ගාල්ල ජාතික කෞතුකාගාරය

14.(ඌ) ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය

14.(එ) නිදහස් අනුස්මරණ කෞතුකාගාරය

14.(ඒ) මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය.

15. 2016 වර්ෂයේ ආදායම 32 - 33

ඡායාරූප

# 2016 වර්ෂය සඳහා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කාර්යය සාධන වාර්තාව

## (1). හැඳින්වීම

අංග සම්පූර්ණ කෞතුකාගාර සේවාවක් රටට ලබාදීම ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන්නේය. මෙම අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා ක්‍රියාකිරීමේදී සාමාන්‍ය වශයෙන් කෞතුකාගාරයක් හා සම්බන්ධ නානාවිධ කාර්යය පථයන් අතරින් අප රටට වඩාත් උචිත වන්නා වූ කාර්යය පථයන් තෝරා ගැනීමට දෙපාර්තමේන්තුවට සිදුවේ. මෙම තෝරා ගැනීමට අදාළ වන ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය පිණිස ලබාගත හැකි විවිධ සම්පත් මෙන්ම රටේ අවශ්‍යතාවය ද සැලකීමට භාජනය කරනු ලැබේ.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම ප්‍රතිපත්ති ප්‍රධාන කොටම ක්‍රියාත්මක කරනු ලබන්නේ, සමස්තයක් වශයෙන් මුළු රටම නියෝජනය කෙරෙන රැස්කිරීම් සම්භාරයකින් සමන්විත වූ කොළඹ ජාතික කෞතුකාගාරය මඟිනි. මීට අමතරව කොළඹ ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය, මහනුවර ජාතික කෞතුකාගාරය, රත්නපුර ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික සමුද්‍ර කෞතුකාගාරය, පිටකොටුවේ ඕලන්ද කෞතුකාගාරය, අනුරාධපුර ජන කෞතුකාගාරය, නිදහස් අනුස්මරණ කෞතුකාගාරය හා මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යනු ලබන අතර, එම ප්‍රදේශවලට ආවේණික සංස්කෘතික සහ ස්වභාවික විද්‍යා උරුමයන් ද විදහා දැක්වීම එකී කෞතුකාගාරවල කාර්යය භාරය වේ. එසේම ජංගම කෞතුකාගාර සේවය ද හේතුකොට ගෙන දෙපාර්තමේන්තුවේ සේවා පථය පුළුල් වී තිබේ. මේ අනුව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව සතු කාර්යයන් පහත දැක්වෙන පරිදි විශ්ලේෂණය කර දැක්විය හැකිය.

I. ප්‍රාග් ඉතිහාසය, මානවවංශ විද්‍යාව, මානව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කීට විද්‍යාව, භූ ගර්භ විද්‍යාව, උද්භිද විද්‍යාව හා පාෂාණධාතු විද්‍යාව යන විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ වන්නා වූ වස්තූන් සහ ආදර්ශ රැස්කිරීම, ලේඛනාරූඪ කිරීම සහ ආරක්ෂා කිරීම.

II. යථෝක්ත ක්ෂේත්‍රයන්හි පර්යේෂණ පැවැත්වීම.

III. විද්වතුන්ගේ මෙන්ම ආධුනිකයන්ගේ ද ප්‍රයෝජනය පිණිස, ස්පෝලියා සෙලනිකා නමැති පර්යේෂණ සංග්‍රහය සහ වෙනත් සඟරා සහ ඒක විෂයක සංග්‍රහයන් ප්‍රකාශයට පත් කිරීම.

IV. රටේ ඉතිහාසය, කලා ශිල්ප හා ස්වාභාවික විද්‍යාවන්ට ද අදාළ වන්නා වූ දැනුම ප්‍රචලිත කිරීම වස් දේශන, ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ ආදියෙන් සමන්විත අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## (2). මූල්‍ය ප්‍රතිපාදන

### (අ). පුනරාවර්තන වියදම්:

| | වෙන් කළ ප්‍රතිපාදන | 2016.12.31 දිනට වියදම | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| සාමාන්‍ය පරිපාලනය | රු.31,008,000 | රු.30,479,795 | 98% |
| කෞතුකාගාර අධ්‍යාපනය | රු.41,610,000 | රු.40.700,011 | 98% |
| කෞතුකාගාර සේවා | රු.87,248,000 | රු.86,666,856 | 99% |
| **එකතුව** | **රු.159,866,000** | **රු.157,846,662** | **99%** |

### (ආ). ප්‍රාග්ධන වියදම:

| | වෙන් කළ ප්‍රතිපාදන | 2016.12.31 දිනට වියදම | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| සාමාන්‍ය පරිපාලනය | රු.5,100,000 | රු.5,032,163 | 99% |
| කෞතුකාගාර අධ්‍යාපනය | රු.6,050,000 | රු.5,759,762 | 95% |
| කෞතුකාගාර සේවා | රු.166,772,000 | රු.165,120,864 | 99% |
| එකතුව (මූලධන වියදම්) | රු.177,922,000 | රු.175,912,789 | 99% |
| **එකතුව** | **රු.337,788,000** | **රු.333,759,451** | **99%** |

### (ඇ). 2016 වර්ෂයේ කෞතුකාගාර දෙපාර්තමේන්තුවට මිලදී ගත් භාණ්ඩ:

- වැය ශීර්ෂ අංකය: 2102 - ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ:

| ව්‍යාපෘතිය | වියදම |
|---|---|
| සාමාන්‍ය පරිපාලනය | රු. 746,892.55 |
| කෞතුකාගාර අධ්‍යාපනය | රු. 482,205.50 |
| කෞතුකාගාර සේවා | රු. 2,206,205.22 |

- වැය ශීර්ෂ අංකය: 2103 - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ:

| ව්‍යාපෘතිය | වියදම |
|---|---|
| සාමාන්‍ය පරිපාලනය | රු. 951,874.84 |
| කෞතුකාගාර අධ්‍යාපනය | රු. 47,405.82 |
| කෞතුකාගාර සේවා | රු. 144,890.50 |

### (ඈ). 2016 වසරේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ව්‍යාපෘති

| | ව්‍යාපෘතිය | 2016 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන(රු.මිලි ) | 2016.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය | 2016.12.31 දිනට භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| 01 | කොළඹ ජාතික කෞතුකාගාරයේ සංරක්ෂණාමය අළුත්වැඩියාව | 131 | 98% | ගොඩනැගිලි ඉදි කිරීම | 100% |
| | | | | ප්‍රදර්ශන සැකසීම | 80% |
| 02 | ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ අස්ථික මැදිරිය ඉදිකිරීම | - | - | ගොඩනැගිලි ඉදි කිරීම | 100% |
| | | | | ප්‍රදර්ශන සැකසීම | 95% |
| 03 | මහනුවර ජාතික කෞතුකාගාරයේ අළුත්වැඩියාව කටයුතු | - | - | ගොඩනැගිලි ඉදි කිරීම | 100% |
| | | | | ප්‍රදර්ශන සැකසීම | 75% |
| 04 | ඕලන්ද කෞතුකාගාරයේ වහල අළුත්වැඩියාව | 11.6 | 100% | මූලික කටයුතු ඉටුකර ඇත. | |
| 05 | මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරයේ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම (අදියර II) | 7.9 | 100% | 125% | |

# (3). ආයතනික කටයුතු

(අ).ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 400 කි

(ආ). ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අනුමත ශ්‍රේණි සංඛ්‍යාව හා දැනට සිටින කාර්ය මණ්ඩලය

| තනතුර | සේවය | වැටුප් කේතය | අනුමත කාර්යය මණ්ඩලය | දැනට සිටින කාර්යය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් ** | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය-විශේෂ | SL 3 | 1 | 0 | 1 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ** | ශ්‍රී ලංකා පරිපාලන සේවය I | SL 3 | 1 | 0 | 1 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ** | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය I | SL 3 | 1 | 0 | 1 |
| ප්‍රධාන ගණකාධිකාරී ** | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය I | SL 1 | 1 | 1 | 0 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක ** | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය I | SL 1 | 1 | 1 | 0 |
| අධ්‍යක්ෂ * | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය I | SL 1 | | 1 | |
| අධ්‍යක්ෂ (විද්‍යා) ** | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය I | SL 1 | 1 | 0 | 1 |
| අධ්‍යක්ෂ (සංස්කෘතික) ** | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය I | SL 1 | 1 | 0 | 1 |
| සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා පරිපාලන සේවය III / II | SL 1 | 1 | 1 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (මානව වංශ විද්‍යා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය III / II | SL 1 | 1 | 1 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (මානව විද්‍යා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය III / II | SL 1 | 1 | 1 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (උද්භිත විද්‍යා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය III / II | SL 1 | 1 | 0 | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (සත්ත්ව විද්‍යා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය III / II | SL 1 | 1 | 1 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (කීට විද්‍යා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය III / II | SL 1 | 1 | 1 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (කෞතුකාගාර සේවා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය III / II | SL 1 | 1 | 0 | 1 |
| ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය III / II | SL 1 | 1 | 1 | 0 |
| පරිපාලන නිලධාරී | රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය (අධිපන්තිය) | MN 7 | 1 | 1 | 0 |
| පුස්තකාලාධිපති | ශ්‍රී ලංකා රජයේ පුස්ථකාලාධිපති සේවය (අධිපන්තිය) | MN 6 | 1 | 0 | 1 |
| භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය II / I | MN 6 | 2 | 1 | 1 |
| කෞතුකාගාර අධිකාරී | දෙපාර්තමේන්තුගත | MN 4 | 5 | 5 | 0 |
| සම්ප්‍රදායික කලා සහකාර | දෙපාර්තමේන්තුගත | MN 4 | 1 | 1 | 0 |
| ප්‍රදර්ශන සැලසුම් නිලධාරී | දෙපාර්තමේන්තුගත | MN 4 | 1 | 0 | 1 |
| අයවැය සහකාර | ආශ්‍රිත සේවා III / II / I | MN 4 | 1 | 1 | 0 |
| සංරක්ෂණ නිලධාරී | ආශ්‍රිත සේවා III / II / I | MN 4 | 2 | 2 | 0 |
| මිලදී ගැනීමේ නිලධාරී | ආශ්‍රිත සේවා III / II / I | MN 4 | 1 | 1 | 0 |
| පර්යේෂණ සහකාර | ආශ්‍රිත සේවා III / II / I | MN 4 | 8 | 8 | 0 |
| පර්යේෂණ සහකාර | දෙපාර්තමේන්තුගත | MN 4 | 6 | 1 | 5 |
| අධ්‍යාපන ප්‍රවර්ධන නිලධාරී | ආශ්‍රිත සේවා III / II / I | MN 4 | 18 | 15 | 3 |
| තොරතුරු තාක්ෂණ සහකාර | ආශ්‍රිත සේවා III / II / I | MN 4 | 1 | 1 | 0 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය 3 – III / II / I | MN 1 | 1 | 0 | 1 |
| වැඩසටහන් සහකාර | ආශ්‍රිත සේවා III / II / I | MN 4 | 1 | 1 | 0 |
| සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවා III / II / I | MN 4 | 2 | 2 | 0 |
| සංවර්ධන නිලධාරී | සංවර්ධන නිලධාරී සේවය III / II / I | MN 4 | 13 | 12 | 1 |
| සංවර්ධන නිලධාරී (දෙමළ) | සංවර්ධන නිලධාරී සේවය III / II / I | MN 4 | 7 | 0 | 7 |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | දෙපාර්තමේන්තුගත | MN 4 | 1 | 0 | 1 |
| කෞතුකාගාර ආරක්ෂක | දෙපාර්තමේන්තුගත | MN 3 | 10 | 4 | 6 |
| කීට විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III / II / I | MN 3 | 2 | 0 | 2 |
| උද්භිත විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III / II / I | MN 3 | 1 | 0 | 1 |
| භූ විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III / II / I | MN 3 | 1 | 1 | 0 |
| මානව විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III / II / I | MN 3 | 1 | 0 | 1 |
| සත්ත්ව විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III / II / I | MN 3 | 1 | 0 | 1 |
| සංරක්ෂණ සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III / II / I | MN 3 | 1 | 0 | 1 |

| | | | | | |
|---|---|---|---|---|---|
| කාර්මික නිලධාරි | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III / II / I | MN 3 | 2 | 0 | 2 |
| පුස්තකාලාධිපති | රජයේ පුස්ථකාලාධිපති සේවය III / II / I | MN 3 | 4 | 2 | 2 |
| ඡායාරූප ශිල්පී | දෙපාර්තමේන්තුගත | MT 3 | 1 | 1 | 0 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය III / II / I | MN 2 | 20 | 14 | 6 |
| චර්ම ශිල්පී | දෙපාර්තමේන්තුගත | MN 1 | 1 | 1 | 0 |
| ආදර්ශ රූප කලාකරු | දෙපාර්තමේන්තුගත | MN 1 | 3 | 2 | 1 |
| ආරක්ෂක සහකාර | දෙපාර්තමේන්තුගත | MN 1 | 5 | 0 | 5 |
| කෞතුකාගාර පිළිගැනීමේ නිලධාරි | දෙපාර්තමේන්තුගත | MN 1 | 1 | 0 | 1 |
| රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය III / II / I | PL 3 | 8 | 5 | 3 |
| ලේඛන ප්‍රතිසංස්කාරක | දෙපාර්තමේන්තුගත | PL 2 | 9 | 6 | 3 |
| උද්‍යාන පාලක | දෙපාර්තමේන්තුගත | PL 2 | 2 | 1 | 1 |
| විදුලි කාර්මික | දෙපාර්තමේන්තුගත | PL 2 | 1 | 1 | 0 |
| වඩු කාර්මික | දෙපාර්තමේන්තුගත | PL 2 | 2 | 1 | 1 |
| පින්තාරුකරු | දෙපාර්තමේන්තුගත | PL 2 | 1 | 1 | 0 |
| පෙදරේරු | දෙපාර්තමේන්තුගත | PL 2 | 1 | 1 | 0 |
| ශ්‍රව්‍ය දෘශ්‍ය සහායක | දෙපාර්තමේන්තුගත | PL 2 | 1 | 1 | 0 |
| මුර පරීක්ෂක | දෙපාර්තමේන්තුගත | PL 1 | 1 | 1 | 0 |
| සහකාර මුර පරීක්ෂක | දෙපාර්තමේන්තුගත | PL 1 | 1 | 1 | 0 |
| කෞතුකාගාර මුරකරු | දෙපාර්තමේන්තුගත | PL 1 | 50 | 48 | 2 |
| පුස්තකාල සහායක | දෙපාර්තමේන්තුගත | PL 1 | 2 | 2 | 0 |
| කෞතුකාගාර සහායක | දෙපාර්තමේන්තුගත | PL 1 | 179 | 126 | 53 |

* නව කෞතුකාගාර පනත සම්මත වන තෙක් බලාත්මක වේ. දැනට නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව විද්‍යා) අධ්‍යක්ෂ තනතුරේ පූර්ණ කාලීනව වැඩ බැලීම සිදුකරයි.

** දෙපාර්තමේන්තුව උත්ශ්‍රේණිගත කිරීම යටතේ අනුමත තනතුරු නව කෞතුකාගාර පනත සම්මත වන තෙක් බලාත්මක නොවේ.

## (ඈ).නව පත්වීම් ලැබී පැමිණි නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | දිනය |
|---|---|---|---|
| 01 | ඒ.එච්.එස්.ශානිකා මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2016.07.04 |
| 02 | ඩබ්.ඒ.ඒ.යූ.විජේවික්‍රම මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2016.07.04 |
| 03 | සී.ඩී.එම්.එම්.සී.තිලකරත්න මයා | කෞතුකාගාර මුරකරු | 2016.06.15 |
| 04 | එච්.එච්.ඒ.ප්‍රේමරත්න මයා | කෞතුකාගාර මුරකරු | 2016.06.15 |
| 05 | ඒ.වී.රඹුක්පිටිය මයා | කෞතුකාගාර මුරකරු | 2016.06.15 |
| 06 | ආර්.ඒ.වී.ලසිත මයා | කෞතුකාගාර මුරකරු | 2016.06.15 |
| 07 | පී.ආර්.එස්.ඩී.බණ්ඩාර මයා | කෞතුකාගාර මුරකරු | 2016.06.15 |
| 08 | එස්.ඩී.ඒ.ගිහාන් සිල්වා මයා | කෞතුකාගාර මුරකරු | 2016.06.15 |
| 09 | එච්.පී.එල්.සරත් කුමාර මයා | කෞතුකාගාර මුරකරු | 2016.06.15 |
| 10 | ඊ.පී.එන්.එදිරිවීර මයා | කෞතුකාගාර මුරකරු | 2016.06.15 |
| 11 | බී.එම්.යූ.බී.බස්නායක මයා | කෞතුකාගාර මුරකරු | 2016.06.15 |
| 12 | ඒ.එම්.එස්.එල්.ඩී.බණ්ඩාර මයා | කෞතුකාගාර මුරකරු | 2016.06.15 |
| 13 | යූ.ආර්.එම්.එල්.බණ්ඩාර මයා | කෞතුකාගාර මුරකරු | 2016.06.15 |

**(ඇ). 2016 වසරේ විශ්‍රාම ලැබීම්**

| අනු අංකය | නම | තනතුර | විශ්‍රාම ගිය දිනය |
|---|---|---|---|
| 01 | බී.ඒ.සිරිසේන මයා | මැදිරි භාරකරු | 2016.02.18 |

**(ඉ). ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|---|
| 01 | එම්.සමන්ත මයා | සංවර්ධන නිලධාරී III | 2016.01.18 |
| 02 | ධනුෂ්ක ගයාන් මාතරගේ මයා | සංවර්ධන නිලධාරී III | 2016.02.03 |
| 03 | පී.පී.ෆොන්සේකා මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2016.03.01 |
| 04 | එච්.එම්.සී.ජේ.සෙනවිරත්න මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2016.03.14 |
| 05 | කේ.ඒ.පී.සදමාලි මිය | සංවර්ධන නිලධාරී III | 2016.08.01 |
| 06 | ඩී.එස්.ද සොයිසා මිය | පරිපාලන නිලධාරී | 2016.09.06 |
| 07 | ඩබ්.එෆ්.ඩී.පී.ප්‍රනාන්දු මයා | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 2016.10.03 |
| 08 | එස්.සී.එන්.ලියනගමගේ මිය | භාෂා පරිවර්තක | 2016.11.24 |

**(ඊ). ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | දිනය |
|---|---|---|---|
| 01 | ඒ.ඒ.එම්.කරුණාතිලක මයා | අධ්‍යාපන ප්‍රවර්ධන නිලධාරී | 2016.08.04 |
| 02 | එන්.එච්.ආර්.සදමාලි මෙය | සංවර්ධන නිලධාරී III | 2016.01.08 |
| 03 | ටී.සී.ජිවන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2016.03.01 |
| 04 | ධනුෂ්ක ගයාන් මාතරගේ මයා | සංවර්ධන නිලධාරී III | 2016.03.31 |
| 05 | කේ.කේ.ගමගේ මයා | පරිපාලන නිලධාරී | 2016.09.08 |
| 06 | එම්.සමන්ත මයා | සංවර්ධන නිලධාරී III | 2016.11.01 |

## (උ). මුදාහරින ලද නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | දිනය |
| --- | --- | --- | --- |
| 01 | නිලන්ති රත්නායක මිය | ලේඛන ප්‍රතිසංස්කාරක | 2016.03.01 |
| 02 | එල්.එච්.තිලක් කුමාර මයා | මැදිරි භාරකරු | 2016.03.01 |
| 03 | බී.එල්.එම්.බුත්පිටිය මයා | මැදිරි භාරකරු | 2016.03.01 |
| 04 | කේ.සිරිවර්ධන මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2016.08.31 |
| 05 | පී.ආර්.ආර්.ප්‍රියමාණි මිය | සංවර්ධන නිලධාරී III | 2016.11.09 |

## (ඌ). තනතුර අතහැර ගිය නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | පත්වීම් දිනය | පතවීම අවසන් කළ දිනය |
| --- | --- | --- | --- | --- |
| 01 | එම්.පී.ඩී.එම්.දිසානායක මයා | කෞතුකාගාර මුරකරු | 2016.06.15 | 2016.07.13 |
| 02 | ඩී.ඩී.ජේ.බණ්ඩාර මයා | කෞතුකාගාර මුරකරු | 2016.06.15 | 2016.06.22 |

## (එ). විදේශීය සමුළු හා විදේශීය පුහුණු

| අනු අංකය | සහභාගි වූ අය | පැවති රට | දිනය | වැඩසටහන |
| --- | --- | --- | --- | --- |
| 01 | කේ.පී.එල්.පී.සෝමරත්න මිය<br>සහකාර අධ්‍යක්ෂ(සත්ත්ව විද්‍යා) | චීනය | 2016.06.22<br>2016.07.12 | Seminar on Conservation & Excavation of culture al Hertage for contries along the belt & road 2016 |
| 02 | ඊ.ඩී.සෙනරත් වික්‍රමසිංහ මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ(මා.ව.වි.) | ඉන්දුනීසියාව | 2016.10.09<br>2016.10.12 | Intersection of culture in the Indian Ocean Region |

## (04) 2016 වර්ෂයේ කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්යයන්

- මහවැලි කේන්ද්‍රයේ ජාතික වාරි කෞතුකාගාරය ඉදිකිරීම සඳහා උපදේශන සේවය ලබා දීම.
- අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා කෞතුකාගාර දෙපාර්තමේන්තුව එක්ව දකුණු කොරියාවේ සංස්කෘතික උරුම ජාතික පර්යේෂණ ආයතනය (NRICH –National Research Institute of Cultural Heritage) විසින් 2016.10.31 සිට 2016.11.10 දක්වා කෞතුක භාණ්ඩ සංරක්ෂණය පිළිබඳ වැඩමුළුවක් ජාතික කෞතුකාගාරයේදී පවත්වන ලදී.
- කොළඹ ජාතික කෞතුකාගාරය, ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරය හා මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය සඳහා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් ස්ථාපනය කරන ලද ජංගම දුරකථන යෙදවුම සඳහා මේ වසරේදී සම්මාන ද්විත්වයක් ජයග්‍රහණය කරන ලදී.

  i. mBillion$^{th}$ දකුණු ආසියානු සම්මාන උළෙල - 2016 ලෝක ජනතාවට ශ්‍රී ලංකා කෞතුකාගාරයන්හි තාත්වික සංචාරයක් කිරීම සඳහා වන ජංගම දුරකථන යෙදවුම සඳහා සම්මාන ලැබීම.

  ii. විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ඉ-ස්වාභිමානී 2016 සම්මාන උළෙලේ "ජාතික හොඳම ඉ කාණ්ඩය යටතේ " වන සම්මානය දිනා ගැනීම.

- වාර්ෂිකව මැයි මස 18 වන දිනට යෙදී තිබෙන ජාත්‍යන්තර කෞතුකාගාර දිනය නිමිත්තෙන් "කෞතුකාගාර හා සංස්කෘතික භූ දර්ශන" (Museum and Cultural Landscapes) යන තේමාව යටතේ ශ්‍රී ලංකාවේ කෞතුකාගාර දින සැමරුම හම්බන්තොට අධ්‍යාපන කලාපයේ පාසැල් සිසුන්ගේ සහභාගිත්වයෙන් මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය කේන්ද්‍ර කර ගනිමින් හම්බන්තොටදී පැවැත්වීම.

# (05). කෞතුකාගාර නරඹන්නන් පිළිබඳ විස්තර

2016 වර්ෂයේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන කෞතුකාගාර නැරඹීම සඳහා පැමිණි නරඹන්නන්ගේ සංඛ්‍යාව පහත පරිදි වේ.

| කෞතුකාගාරයේ නම | දේශීය | | විදේශීය | | පාසැල් | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | වැඩිහිටි | ළමා | වැඩිහිටි | ළමා | ගුරුවරු | ළමයි | නොමිලේ | එකතුව |
| කොළඹ ජාතික කෞතුකාගාරය | 52800 | 15686 | 44756 | 1887 | 7921 | 89685 | 1593 | 214328 |
| ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය | 16190 | 6533 | 4903 | 400 | 3216 | 38948 | 1123 | 71313 |
| ඕලන්ද කෞතුකාගාරය | 4676 | 442 | 3930 | 160 | 38 | 354 | 0 | 9600 |
| රත්නපුර ජාතික කෞතුකාගාරය | 12273 | 3105 | 119 | 16 | 765 | 12184 | 152 | 28614 |
| මහනුවර ජාතික කෞතුකාගාරය | **සංරක්ෂණ නවීකරණ කටයුතු සඳහා තාවකාලිකව වසා ඇත.** | | | | | | | |
| ගාල්ල ජාතික කෞතුකාගාරය | 141 | 32 | 166 | 08 | 52 | 834 | 09 | 1242 |
| සමුද්‍ර කෞතුකාගාරය | 12162 | 3155 | 2655 | 270 | 1722 | 23741 | 0 | 43705 |
| අනුරාධපුර ජන කෞතුකාගාරය | 3275 | 788 | 167 | 02 | 448 | 2794 | 1454 | 8928 |
| නිදහස් අනුස්මරණ කෞතුකාගාරය | 13346 | 1145 | 459 | 42 | 1186 | 10930 | 173 | 27281 |
| මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය | 984 | 218 | 42 | 0 | 38 | 747 | 80 | 2109 |
| **එකතුව** | 115847 | 31104 | 57197 | 2785 | 15386 | 180217 | 4584 | 407120 |

# (06). විවිධ විෂයානුබද්ධ අංශවල කටයුතු

## (අ). සංස්කෘතික අංශ

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ සංස්කෘතික අංශය, මානව වංශ විද්‍යා හා මානව විද්‍යා යන අංශ දෙකෙන් සමන්විත වේ. එක් එක් අංශවලට අයත් භාණ්ඩ එක්රැස් කිරීම, ප්‍රදර්ශනය, ගබඩා කිරීම, සංරක්ෂණය, ලේඛනගත කිරීම, අධ්‍යයනය හා අධ්‍යාපනය ලබා දීම මෙම අංශය මගින් සිදු කෙරෙන ප්‍රධාන කාර්යයන් වෙයි.

# (1). මානව වංශ විද්‍යා අංශය

### (අ). රැස්කිරීම් හා ලේඛනගත කිරීම්

මානව වංශ විද්‍යා අංශය විසින් මේ වසරේදී රැස්කර ගන්නා ලද භාණ්ඩ හා ලේඛනගත කිරීම් පිළිබද විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | භාණ්ඩය | ලි.ප. අංකය |
|---|---|---|
| 01 | Brass Bell | 2016.01.01 |
| 02 | A Ceylon Government Symbol | 2016.02.01 |
| 03 | Metal Puncher | 2016.03.01 |
| 04 | Solid stencil ink pad (03) | 2016.04.01, 2016.04.02, 2016.04.03 |
| 05 | Tree hand cuff (03) | 2016.05.01, 2016.05.02, 2016.05.03 |
| 06 | Decorated brick | 2016.06.01 |
| 07 | Apart of Figure pedestal | 2016.07.01 |
| 08 | Copper Massa coin | 2016.09.01 |
| 09 | Serakkalaya | 2016.10.01 |
| 10 | කැල්ලේ තඹ සන්නස | 2016.11.01 |

| | | |
|---|---|---|
| 11 | a) A Collection of Anticuties<br>I. Sinhala copper Massa Coin<br>II. Britsh Coin<br>III. Britsh Five (05)cent Coin<br>IV. Britsh One cent Coin<br>V. South Indian Coin<br>b) Two Beads<br>I. White colour<br>II. Green colour<br>c) Two small Sea Shells<br>I. –<br>II. –<br>d) Small Vase | 2016.24.01<br>2016.24.02<br>2016.24.03<br>2016.24.04<br>2016.24.05<br>2016.25.01<br>2016.25.02<br>2016.26.01<br>2016.26.02<br>2016.27.01 |
| 12 | Samadhi Buddha Image | 2016.28.01 |
| 13 | A Batton | 2016.29.01 |
| 14 | A dragger | 2016.30.01 |
| 15 | Bodhisathwa Image | 2016.31.01 |
| 16 | An Official uniform of Kithalaru Arachchi | 2016.32.01 |

**(ආ). පර්යේෂණ**

මානව වංශ විද්‍යා අංශය විසින් මේ වසරේදී කරන  ලද පර්යේෂණ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

1. 2016.10.10 දින හා 11 දින ඉන්දුනීසියාවේ පැවැත්වූ Indian ocean Rim Assosiation පර්යේෂණ සමළුව සඳහා Trade contact betweenSri lankaand South India Replected By the coins මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිපත් කිරීම.

11. ලංකාවෙන් හමුවූ දකුණු ඉන්දියානු චෝල, පාණ්ඩ්‍ය කාසි පිළිබඳව පර්යේෂණයක් පැවැත්වීම.

**(ඇ). ප්‍රදර්ශන**

මානව වංශ විද්‍යා අංශය මඟින් මේ වසරේදී ජංගම ප්‍රදර්ශන 09 ක් පවත්වන ලදී.

**(ඈ).වැඩමුළු හා සම්මන්ත්‍රණ -**

- රත්නපුර සීවලී මහා විද්‍යාලයේ ඉතිහාසය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්  500ක් සඳහා ප්‍රාග් ඉතිහාසය, ඓතිහාසික මූලාශ්‍ර, ලංකාවේ පැරණි තාක්ෂණය යන මාතෘකා යටතේ දේශන සහ වැඩමුළුවක් පැවැත්වීම.

**(ඉ). බාහිර සේවා**

- පාසල්, විශ්ව විද්‍යාල හා වෙනත් විද්වතුන් 110 කට පමණ තොරතුරු ලබා දීම.

**(ඊ). වෙනත් කටයුතු**

- Inspirations of the past වර්ණ පිංතූර කට්ටලය සකස් කිරීම සඳහා අවශ්‍ය ඡායාරූප තෝරා දීම, තොරතුරු ලබා දීම හා සෝදුපත් බැලීම.

- මහනුවර ජාතික කෞතුකාගාරයේ ප්‍රතිසංවිධාන කටයුතු, අධීක්ෂණය හා අවශ්‍ය විෂයානුබද්ධ දැනුම ලබා දීම.

- රත්නපුර, මහනුවර හා නිදහස් අනුස්මරණ කෞතුකාගාර වල හා සංරක්ෂණ අංශය, ප්‍රදර්ශන සැළසුම් අංශය හා කෞතුකාගාර පුස්තකාලයේ අධීක්ෂණ කටයුතු කිරීම.

## (2). මානව විද්‍යා අංශය

### (අ). රැස් කිරීම්, හඳුනා ගැනීම් හා ලේඛනගත කිරීම්.

| අනු අංකය | භාණ්ඩය | භාණ්ඩය අත්පත් කරගත් දිනය | භාණ්ඩය අත්පත් කරගත් ආකාරය | ලියාපදිංචි අංකය | ලියාපදිංචි කල දිනය | භාණ්ඩය අත්පත් කරගත් ප්‍රදේශය |
|---|---|---|---|---|---|---|
| 01 | හුණු කිල්ලෝටය | 2016.02.18 | හුවමාරු | 2014.6.1 | 2014.09.15 | පුත්තලම (මානව වංශ විද්‍යා අංශයෙන් මානව විද්‍යා අංශයට භාර දෙන ලද භාණ්ඩයකි) |
| 02 | ලාහ | 2016.02.18 | පරිත්‍යාග | 2016.8.1 | 2016.02.23 | කළුතර |
| 03 | හිස වෙස් තට්ටුව | 2016.06.23 | පරිත්‍යාග | 2016.12.1 | 2016.07.04 | කෑගල්ල |
| 04 | පායිම්පත | 2016.06.23 | පරිත්‍යාග | 2016.13.1 | 2016.07.04 | කෑගල්ල |
| 05 | පායිම්පත | 2016.06.23 | පරිත්‍යාග | 2016.14.1 | 2016.07.04 | කෑගල්ල |
| 06 | කලාගුරු සවුරිස් සිල්වාගේ අත් පිටපත් | 2016.07.07 | පරිත්‍යාග | 2016.15.1 | 2016.07.14 | කැනඩාව |
| 07 | කලාගුරු සවුරිස් සිල්වාගේ අත් පිටපත් | 2016.07.07 | පරිත්‍යාග | 2016.16.1 | 2016.07.14 | කැනඩාව |
| 08 | කලාගුරු සවුරිස් සිල්වාගේ අත් පිටපත් | 2016.07.07 | පරිත්‍යාග | 2016.17.1 | 2016.07.14 | කැනඩාව |
| 09 | කලාගුරු සවුරිස් සිල්වාගේ අත් පිටපත් | 2016.07.07 | පරිත්‍යාග | 2016.18.1 | 2016.07.14 | කැනඩාව |
| 10 | කලාගුරු සවුරිස් සිල්වාගේ අත් පිටපත් | 2016.07.07 | පරිත්‍යාග | 2016.19.1 | 2016.07.14 | කැනඩාව |
| 11 | කලාගුරු සවුරිස් සිල්වාගේ අත් පිටපත් | 2016.07.07 | පරිත්‍යාග | 2016.20.1 | 2016.07.14 | කැනඩාව |
| 12 | ආභරණ පෙට්ටිය | 2016.08.10 | පරිත්‍යාග | 2016.21.1 | 2016.08.15 | කොළඹ |
| 13 | පිගන් මැටි බන්දේසිය | 2016.08.10 | පරිත්‍යාග | 2016.22.1 | 2016.08.15 | කොළඹ |
| 14 | පිගන් මැටි භාජනය | 2016.08.10 | පරිත්‍යාග | 2016.23.1 | 2016.08.15 | කොළඹ |

**(ආ). පර්යේෂණ**

- තාක්ෂණික ගෝලීයකරණය හමුවේ අභියෝගයන්ට ලක්වී ඇති කර්මාන්ත පිළිබඳ තොරතුරු සෙවීමේ අරමුණෙන් බෙර කර්මාන්තය පිළිබඳ පර්යේෂණයක් සිදු කිරීම.
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ සාම්ප්‍රදායික ගම්වල ජීවත්වන ජනතාවගේ ජීවන ක්‍රම හා කර්මාන්තවල වර්තමාන තත්ත්වය කෙසේද යන්න පිළිබඳ පර්යේෂණයක් සිදු කිරීම.

**(ඇ). ක්ෂේත්‍ර චාරිකා**

- අලවල සහ අවට ගම්මාන වල සාම්ප්‍රදායික බෙර කර්මාන්තය පිළිබඳව සිදුකරන ලද ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව.
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ සාම්ප්‍රදායික ගම්වල සිදු කරන ලද ක්ෂේත්‍ර චාරිකාව

**(ඈ). ජංගම ප්‍රදර්ශන**

මානව විද්‍යා අංශය මඟින් මේ වසරේ නොවැම්බර් මස 04 වන දින ගාල්ල දිස්ත්‍රික් සාහිත්‍ය කලා මහෝත්සවය වෙනුවෙන් ගාල්ල, හෑගල්ල මහා විද්‍යාලයේ දී "ශ්‍රී ලංකාවේ කෝලම් සම්ප්‍රදාය" නමින් ජංගම ප්‍රදර්ශනයක් පවත්වන ලදී.

**(ඉ). බාහිර සේවා**

- දේශීය හා විදේශීය රටවලින් අධ්‍යයන කටයුතු සඳහා පැමිණෙන විද්‍යාර්ථයන්ට හා විශ්ව විද්‍යාල, පාසැල් සිසුන්ට අවශ්‍ය තොරතුරු ලබා දීම

**(ඊ). වෙනත් කටයුතු**

- මානව විද්‍යා කෞතුක භාණ්ඩ එකතුවෙන් භාණ්ඩ 90 ක් ඡායාරූප ගත කරවීම.
- රත්නපුර කෞතුකාගාරයෙන් හා මහනුවර කෞතුකාගාරයෙන් සංරක්ෂණය සඳහා භාණ්ඩ රැගෙන ඒම.
- කරත්ත, වෙස්මුහුණු, වැදි භාණ්ඩ, කෘෂිකර්ම මැදිරි සතියකට දින 3ක් පරික්ෂා කිරීම හා නඩත්තු අංශය මගින් අවශ්‍ය නඩත්තු කටයුතු සිදුකරවීම.
- මානව විද්‍යා අංශයේ දත්ත ගබඩාවට දත්ත ඇතුළත් කිරීම.
- අංශයට අයත් අනෙකුත් රාජකාරි

## (ආ). විද්‍යාත්මක අංශ.

උද්භිද විද්‍යා, කීට විද්‍යා, භූ විද්‍යා, සත්ත්ව විද්‍යා යන අංශ මෙයට අයත් වේ. ඒ ඒ අංශවලට අයත් භාණ්ඩ හා ආදර්ශක රැස්කිරීම, නඩත්තු කිරීම, ප්‍රදර්ශනය, එම භාණ්ඩ හා ආදර්ශක පිළිබඳ පර්යේෂණ කරන්නා වු බාහිර විද්වතුන්ට සහයෝගය ලබාදීම හා ජනතාව දැනුවත් කිරීමේ කටයුතු මෙම අංශ මගින් කෙරෙන ප්‍රධාන කාර්යයන් වෙයි.

## (1). උද්භිද විද්‍යා අංශය.

### (අ). අදාළ වර්ෂය තුළ සිදු කරන ලද රැස් කිරීම්

| දින | එක් රැස් කරන ලද ස්ථානයන් | එක් රැස් කරන ලද ශාක ආදර්ශක ගණන |
|---|---|---|
| 2016 ඔක්තෝබර් 06-08 | • සීතාවක තෙත් කළාපීය උද්භිද උද්‍යානය (අධ්‍යන චාරිකාවක්)<br>• මාකන්දාව රක්ෂිතය (කිතුල්ගල)<br>• හොරගොල්ල රක්ෂිතය<br>• කෑගල්ල ප්‍රදේශය (කුරුළු කැලේ වන රක්ෂිතය) | 72 |
| 2016 දෙසැම්බර් 14-20 | පේරාදෙණිය උද්භිද උද්‍යානය<br>(එක් රැස් කර ගත් ශාක හඳුනා ගැනීම සහ නව ශාක එක් රැස් කිරීම.) | 65 |

(ආ) **හඳුනා ගැනීම් හා ලේඛනගත කිරීම්**

| | |
|---|---|
| • සීතාවක තෙත් කළාපීය උද්භිද උද්‍යානය<br>• මාකන්දාව රක්ෂිතය<br>• හොරගොල්ල රක්ෂිතය<br>• කෑගල්ල ප්‍රදේශය (වන රක්ෂිතය) | එක් රැස් කරන ලද ආදර්ශක 72න් 55ක් නිවැරදිව හඳුනා ගන්නා ලදී.<br>හඳුනා ගැනීම සඳහා<br>අධීක්ෂණය-<br>පේරාදෙණිය උද්භිද උද්‍යානය ජාතික ශාකාගාරයේ වැඩ බලන<br>සහකාර අධ්‍යක්ෂ නදීකා ගුණවර්ධන |
| පේරාදෙණිය උද්භිද උද්‍යානය | හඳුනා ගැනීම සඳහා සහාය වීම - පර්යේෂණ සහකාර භාතිය බණ්ඩාර<br>ජාතික ශාකාගාරය, පේරාදෙණිය උද්භිද උද්‍යානය |

**(ඈ). සංරක්ෂණය කරන ලද භාණ්ඩ හා ආදර්ශවල විස්තර**

| එක් රැස් කරන ලද ස්ථානයන් | ආදර්ශක ගණන |
|---|---|
| • සීතාවක තෙත් කළාපීය උද්භිද උද්‍යානය<br>• මාකන්දාව රක්ෂිතය<br>• හොරගොල්ල රක්ෂිතය<br>• කෑගල්ල ප්‍රදේශය (වන රක්ෂිතය) | 72 |
| පේරාදෙණිය උද්භිද උද්‍යානය | 65 |

**(ඇ). ක්ෂේත්‍ර චාරිකා**

| දින | එක් රැස් කරන ලද ස්ථානයන් | එක් රැස් කරන ලද ශාක ආදර්ශක ගණන |
|---|---|---|
| 2016 ඔක්තෝබර් 06-08 ක්ෂේත්‍ර චාරිකාව | • සීතාවක තෙත් කළාපීය උද්භිද උද්‍යානය<br>• මාකන්දාව රක්ෂිතය<br>• හොරගොල්ල රක්ෂිතය<br>• කෑගල්ල ප්‍රදේශය (වන රක්ෂිතය) | 72 |
| 2016 දෙසැම්බර් 14-20 ක්ෂේත්‍ර චාරිකාව | පේරාදෙණිය උද්භිද උද්‍යානය | 65 |

**(ඉ). ජංගම ප්‍රදර්ශන -**

- උද්භිද විද්‍යා අංශය මඟින් මේ වසරේදී ජංගම ප්‍රදර්ශන 05 ක් පවත්වන ලදී.

**(ඊ). වැඩමුළු හා සම්මන්ත්‍රණ**

2016 මැයි 31 - ජාතික සත්ත්ව උද්‍යාන දෙපාර්තමේන්තුව, ජගත් පරිසර දිනයට සමගාමීව අප දෙපාර්තමේන්තු පරිශ්‍රයේ දී සත්ත්ව උද්‍යාන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 30 දෙනෙකු ස ඳහා දේශන සිදු කරන ලදී .

- 2016 ජූලි 07-31 - බඩල්ගම කොස්හේන , ශ්‍රී විශුද්ධාරාමය දී පොදු දේ දේශන කීපයක් සිදු කිරීම.
- 2016 අගෝස්තු - වන ජීවී සංවර්ධන දෙපාර්තමේන්තුවේ රක්ෂිත භාර නිලධාරීන්ගේ වැඩ මුළුවක් සඳහා අදාල දේශන පැවැත් වීම.
- 2106 ඔක්තෝබර් 10-14 - නුගේගොඩ, අනුලා විද්‍යාලයීය සිසුවියන් සඳහා උද්භිද විද්‍යා විෂය සම්බන්ධ දේශන මාලාවක් සිදු කිරන ලදී.

### (උ). බාහිර සේවා

- කැළණිය සරසවියේ සංචාරක සේවා කළමණාකරණ පාඨමාලාව හදාරණ ශිෂ්‍යාවකගේ විශ්ව විද්‍යාල අවසන් වසර නිබන්ධනය (ශ්‍රී ලංකාවේ ආගමික පරිසරයක් සහිත ශාක පිළිබඳව සමීක්ෂණය) සඳහා දායකත්වය ලබා දීම.

### (ඌ). වෙනත් කටයුතු

- කෞතුකාගාර උද්‍යානයේ නඩත්තු කටයුතු/ අධීක්ෂණ කටයුතු පිළිබඳ උපදෙස් අදාල ආයතනයට ලබා දීම.
- කෞතුකාගාර භූමියේ ඇති කසල ගොඩවල් අවශ්‍ය අවස්ථාවල දී කොළඹ මහ නගර සභාව මඟින් අවම මුදලකට කෞතුකාගාර භූමියෙන් නිසි ලෙස බැහැර කිරීම.
- කොළඹ කෞතුකාගාරයට ඇතුල්වන ස්ථානයේ පොකුණක් ඉදි කිරීම.
- අධ්‍යක්ෂ කාර්යාලය ඉදිරිපිට වතුර මල් දෙකක් ඉදි කිරීම.
- කොළඹ කෞතුකාගාර භූමි පරිශ්‍රයට අවශ්‍ය මල් පැළ මිල දී ගැනීම.
- උද්භිද විද්‍යා අංශයට අයත් ශාකාගාරය යාවත්කාලීන කිරීම.

## (2). කීට විද්‍යා අංශය

### (අ). අදාළ වර්ෂය තුළ සිදුකරන ලද රැස් කිරීම්, හඳුනා ගැනීම් හා ලේඛන ගත කිරීම්.

- හෝර්ටන් තැන්න ජාතික වනෝද්‍යානය, පට්ටිපොල සහ කන්දෙඇල රක්ෂිත ආදී ප්‍රදේශයන්හි සිදුකරන ලද ක්ෂේත්‍ර චාරිකාව මඟින් ගෝත්‍ර 11කට අයත් නිදර්ශක 173 ක් රැස් කිරීම.
- ලංකාවේ මකුළුවන්ගේ එකතුව ලේඛන ගත කිරීම.

### (ආ). ක්ෂේත්‍ර චාරිකා

- 2016-08-19 සිට 23 දක්වා හෝර්ටන් තැන්න ජාතික වනෝද්‍යානය, පට්ටිපොල සහ කන්දෙඇල රක්ෂිත ආදී ස්ථාන වෙත ගමන් කර නිදර්ශක රැස් කිරීම.

### (ඇ). ජංගම ප්‍රදර්ශන.

කීට විද්‍යා අංශය මඟින් මේ වසරේදී ජංගම ප්‍රදර්ශන 08 ක් පවත්වන ලදී.

### (ඈ). වැඩමුළු හා සම්මන්ත්‍රණ

- ශ්‍රී ලංකා වනජීවී පුහුණු කේන්ද්‍රයේ පුහුණුව ලබන නිලධාරීන් සඳහා පවත්වන ලද වැඩමුළුව (2016-5-26)
- සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අයත් කීට විද්‍යා පාසලේ පුහුණුව ලබන කීට විද්‍යා සහකාරවරුන් සඳහා වැඩමුළු දෙකක් පැවැත්වීම. (2016.03.20 හා 2016.10.12)

### (ඉ). බාහිර සේවා

- 2016.02.09 දින කොළඹ විශ්ව විද්‍යාලයේ සත්ත්ව විද්‍යා විශේෂ උපාධිය හදාරන 3 වසර සිසුන් සඳහා dung beetle කෘමීන් අධ්‍යයනයට අවශ්‍ය පර්යේෂණ පහසුකම් සැපයීමග
- 2016.02.24 දින කොළඹ විශ්ව විද්‍යාලයේ සත්ත්ව විද්‍යා විශේෂ උපාධිය හදාරන යසිරි අමරසේකර ශිෂ්‍යාව සඳහා මකුළු එකතුව අධ්‍යයනයට අවශ්‍ය පර්යේෂණ පහසුකම් සැපයීමග
- 2016.11.25 දින කොළඹ විශ්ව විද්‍යාලයේ උද්භිද විද්‍යා විශේෂ උපාධිය හදාරන ලක්ෂිකා මානවඩු ශිෂ්‍යාව සඳහා ශාක පරාගනයට අදාල කෘමීන් අධ්‍යයනයට අවශ්‍ය පර්යේෂණ පහසුකම් සැපයීමග
- කොළඹ මහ නගර සභාවෙන් එවනු ලැබූ 254/ CA/MP/157 දරණ දෙහි යුෂ සාම්පලයට අදාල හඳුනා ගැනීමේ වාර්තාව ලබා දීම.
- කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක B/2695/16 දරණ නඩුවට අදාල හඳුනාගැනීම් වාර්තාව ලබා දීම.
- මාතර අතිරේක මහෙස්ත්‍රාත් wêLRk නඩු අංක BR/1685/16 දරණ නඩුවට අදාල හඳුනාගැනීම් වාර්තාව ලබාදීම.
- කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක B/3816 දරණ නඩුවට අදාල හඳුනාගැනීම් වාර්තාව ලබාදීම.

## (ඊ) වෙනත් කටයුතු

- ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ කීට විද්‍යා මැදිරිය නඩත්තු කිරීම
- කෞතුකාගාර භූමියේ සකසා තිබෙන සමනල උයනේ නඩත්තු කටයුතු සිදු කිරීම

## (3). භූ විද්‍යා අංශය.

**(අ). පර්යේෂණ :**

- පුරාසික, මයෝසීන හා ප්ලයිස්ටොසීන අවධීන්ට අයත් ශ්‍රී ලාංකික පොසිල අවශේෂ ආශ්‍රිතව එම අවධීන් නැවත ප්‍රතිනිර්මාණය කිරීම.
- පෘථිවියේ ආරම්භය හා විවිධ භූ යුග ඔස්සේ ජීවීන්ගේ ආරම්භය හා විකාශනය පිළිබඳ අධ්‍යනයක් සිදු කිරීම.

**(ආ). ස්ථිර ප්‍රදර්ශන**

භූ විද්‍යා ස්ථිර ප්‍රදර්ශන මැදිරි නවීකරණය සඳහා අවශ්‍ය පහත සඳහන් කටයුතු සිදුකිරීම.

- භූ විද්‍යා ස්ථිර ප්‍රදර්ශන මැදිරිය පිහිටි ගොඩනැගිල්ල නවීකරණය කොට තීන්ත ආලේප කිරීම.
- ප්‍රදර්ශන පුවරු සැලසුම් කිරීම හා නිර්මාණය කිරීම.
- ප්‍රදර්ශන ආකෘති සඳහා පසුතල ඡායාරූප සැලසුම් කිරීම හා නර්මාණය කිරීම
- ලෝක ගෝල ආකෘතිය භ්‍රමණය වන පරිදි නිර්මාණය කිරීම.
- භූ විද්‍යා ස්ථිර ප්‍රදර්ශන මැදිරියෙහි ආලෝකකරණය සිදුකිරීම.
- ප්‍රදර්ශන අල්මාරි සඳහා පිරිවිතර සැකසීම හා නිර්මාණය කිරීම.
- භූ විද්‍යා ස්ථිර ප්‍රදර්ශන මැදිරිය සඳහා අවශ්‍ය ලේබල් නිර්මාණය කිරීම.
- වාර්ථා වැඩසටහන විකාශනය කිරීම සඳහා රූපවාහිනී යන්ත්‍රයක් මිලදී ගැනීම.
- භූ විද්‍යා ස්ථිර ප්‍රදර්ශන මැදිරිය සඳහා පෘථිවි ඉතිහාසය පිළිබඳව වාර්තා වැඩසටහනක් නිර්මාණය කිරීම.

**(ඇ). බාහිර සේවා**

භූ විද්‍යා ආදර්ශක සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම සදහා පහත සදහන් පර්යේෂකයන් හට අවශ්‍ය සහයෝගය හා තොරතුරු ලබාදීම.

| අංකය | පර්යේෂකයා | දිනය | අධ්‍යනය කරන ලද ආදර්ශක එකතුව |
|---|---|---|---|
| 01 | මහාචාර්ය මිරෝයුකී ඇතුළු පර්යේෂකයන් ජපානය | 2016. 1. 5 | ප්‍රාග් ඓතිහාසික ගල් ආයුධ අධ්‍යයනය |

| | | | |
|---|---|---|---|
| 02 | කැළණිය විශ්ව විද්‍යාලයේ සොනාලි ප්‍රේමරත්න මෙනවිය | 2016 .1. 20 සිට 2016. 12 .31 දක්වා | බෙල්ලන්බැඳි පැලැස්ස මානව අස්ථි අධ්‍යයනය |
| 03 | ආචාර්යය මතියස් ඇතුළු පර්යේෂකයන් ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය ඔස්ට්‍රියාව | 2016. 9. 7 | ෆොසිල පිළිබඳ තොරතුරු ලබාදීම. |
| 04 | පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පී දෙල්ගහපිටිය මහත්මිය | 2016 .4. 25 | පුරාසික ෆොසිල පිළිබඳ තොරතුරු ලබාදීම. |
| 05 | වනජීවී දෙපාර්තමේන්තුව | 2016 .6. 21 | භූ විද්‍යා අංශය පිළිබඳ තොරතුරු ලබාදීම. |

# (4). සත්ත්ව විද්‍යා අංශය

### (අ). අදාළ වර්ෂය තුළ සිදුකරන ලද රැස් කිරීම්

- ගම්පහ රදාවාන ප්‍රදේශයෙන් මියගිය වඳුරෙකුගේ නිදර්ශකයක් රැගෙන ඒම.
- වන ජීවී දෙපාර්තමේන්තුවෙන් මියගිය හඳුන් දිවියෙකුගේ නිදර්ශකයක් රැගෙන ඒම.
- මීගමුව ප්‍රදේශයෙන් මියගිය මෝරකුගේ ආදර්ශකයක් රැගෙන ඒම.
- පේරාදෙණිය පශු වෛද්‍ය පීඨයෙන් මියගිය දිවියෙකුගේ නිදර්ශකයක් රැගෙන ඒම.
- දෙනියාය ප්‍රදේශයෙන් මියගිය ආඳකුගේ ආදර්ශකයක් රැගෙන ඒම.
- පිළියන්දල ප්‍රදේශයෙන් මියගිය හඳුන් දිවියෙකුගේ ආදර්ශකයක් රැගෙන ඒම.
- රත්මලාන ප්‍රදේශයෙන් මියගිය බොරු මිනී-තල්මසාගේ ආදර්ශකයක් රැගෙන ඒම.
- පානදුර ප්‍රදේශයෙන් මියගිය මුහුදු කැස්බෑවෙකුගේ ආදර්ශකයක් රැගෙන ඒම.
- වෙන්නප්පුව ප්‍රදේශයෙන් මියගිය නාගයකුගේ ආදර්ශකයක් රැගෙන ඒම.

### (ආ). හඳුනාගැනීම් හා ලේඛනගත කිරීම්.

- ආචාර්ය ඩිනසාඩි රහීම් මෙනවිය විසින් ගොළුබෙලි නිදර්ශක 74 ක් හඳුනා ගැනීම සහ ලේඛනගත කිරීම.
- ආචාර්ය මාධව මීගස්කුඹුර මහතා විසින් තැන්පත් කරන ලද මත්ස්‍යයින් 3 ක් හඳුනා ගැනීම සහ ලේඛනගත කිරීම.
- මෙන්ඩිස් වික්‍රමසිංහ මහතා විසින් 'හාල් දණ්ඩා'උරග විශේෂය තැන්පත් කිරීම හා ලේඛන ගත කිරීම.

- මෙන්ඩිස් වික්‍රමසිංහ මහතා විසින් හුනු විශේෂ 1 ක් තැන්පත් කිරීම හා ලේඛනගත කිරීම.
- මෙන්ඩිස් වික්‍රමසිංහ මහතා විසින් උරග විශේෂ 1 ක් තැන්පත් කිරීම හා ලේඛනගත කිරීම.
- ආචාර්ය යශෝධා හිරිමුතුගොඩ මහත්මිය විසින් හුංගා විශේෂයට අයත් මත්ස්‍යයින් 4 ක් තැන්පත් කිරීම හා ලේඛනගත කිරීම.

(ඇ) පර්යේෂණ

- අස්ථික මැදිරිය සඳහා අත් පත්‍රිකාව සකස් කිරීමට අවශ්‍ය ග්‍රන්ථ පරිශීලනය සහ අත් පත්‍රිකාව සැකසීම.
- අස්ථික මැදිරියට අවශ්‍ය විස්තර අධ්‍යයන කර ප්‍රදර්ශන පුවරු සැකසීම.

## (ඈ). ස්ථිර/තාවකාලික හා ජංගම ප්‍රදර්ශන

සත්ත්ව විද්‍යා අංශය මඟින් මේ වසරේදී ජංගම ප්‍රදර්ශන 07 ක් පවත්වන ලදී.

## (ඉ). වැඩමුළු හා සම්මන්ත්‍රණ

- විවෘත විශ්ව විද්‍යාලයේ සිසුන් හට මුහුදු බෙලි කවච සංරක්ෂණය කිරීම සදහා ප්‍රදර්ශනය කිරීම සඳහා අවශ්‍ය දේශන පැවැත්වීම. (2016.11.17)
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පළමු වසර සිසුන් හට සත්ත්ව ඇටසැකිලි පිළිබඳ සංසන්දනාත්මකව අධ්‍යනයක් සඳහා දේශන පැවැත්වීම.
- කොළඹ විශ්ව විද්‍යාලයේ අවසන් වසර සත්ත්ව විද්‍යාවේදී සිසුන් සදහා ක්‍රස්ටේෂියාවන් පිළිබඳ අධ්‍යනයට අවස්ථාවන් ලබා දීම.
- වනජීවී දෙපාර්තමේන්තුවේ වන ජීවී නිලධාරීන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම. (2016.06.21)
- ජාතික සත්වෝද්‍යාන කාර්යය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා වැඩමුළුවක් පැවැත්වීම. (2016.05.31)

## (ඊ). බාහිර සේවා

- පර්යේෂක සමීර කරුණාරත්න සහ මපින්ත මඩවලට හුනු නිදර්ශක අධ්‍යයනය සඳහා අවශ්‍ය සහය ලබා දීම.
- පර්යේෂක සමීර කරුණාරත්න, මාධව බොතේජු ට හුනු නිදර්ශක අධ්‍යයනය සදහා අවශ්‍ය සහය ලබා දීම.
- කොළඹ විශ්ව විද්‍යාලයේ සිසුන් හට උරඟ නිදර්ශක අධ්‍යනයට සඳහා පහසුකම් සැපයීම.
- පර්යේෂක සුදේශ් බටුවිට මහතාට සිකනලුන් අධ්‍යනයට සඳහා පහසුකම් සැපයීම.

- පර්යේෂක හිරණ්‍ය සුදසිංහ මහතාට මත්ස්‍ය විශේෂ අධ්‍යයනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම.
- සුනෙත් කණිෂ්ක සහ දිනෙත් දනුෂ්ක පර්යේෂකයන් දෙදෙනාට හාල්දණ්ඩා උරග විශේෂය අධ්‍යයනය කිරීමට අවස්ථාව සලසා දීම.
- කොළඹ විශ්ව විද්‍යාලයේ සිසුන් හට උරග නිදර්ශක අධ්‍යයනයට සඳහා පහසුකම් සැපයීම.
- කොළඹ විශ්ව විද්‍යාලයේ සිසුන් සඳහා පක්ෂීන් අධ්‍යයනයට සඳහා පහසුකම් සැපයීම.
- ස්විට්ර්ලන්තයේ verm uva ශිෂ්‍යාවගේ පශ්චාත් උපාධිය සදහා Barn owl නිදර්ශක අධ්‍යයනයට පහසුකම් සැපයීම.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සිසු සිසුවියන් සඳහා සතුන්ගේ ව්‍යුහීය විද්‍යා අධ්‍යයනයට පහසුකම් සැපයීම.
- උ.පො.ස උසස් පෙළ සිසුවියකට පක්ෂීන් අධ්‍යයනයට සඳහා පහසුකම් සැපයීම.
- තිස්සමහාරාම මහේස්ත්‍රාත් අධිකරණයෙන් ගෙනෙන ලද නඩු අංක 25565/14 දරණ නඩුවට අදාල වාර්තාව ලබා දීම.
- අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී 599/16 දරණ නඩුවට අදාල වාර්තාව ලබා දීම.
- මොණරාගල මහේස්ත්‍රාත් අධිකරණයෙන් ගෙනෙන ලද නඩු අංක 552/16 දරණ නඩුවට අදාල වාර්තාව ලබා දීම.

## (උ). වෙනත් කටයුතු

- සත්ත්ව විද්‍යා රසායනාගාරයේ පැරණි සත්ත්ව එකතුවෙහි තිබෙන උරග එකතුව යාවත්කාලීන කර දත්ත පරිගණක ගත කිරීම.
- WHT සත්ත්ව එකතුවෙහි මත්ස්‍ය නිදර්ශක එකතුව යාවත්කාලීන කිරීම සහ එහි දත්ත පරිගණක ගත කිරීම.
- ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ සත්ත්ව නිදර්ශක වල පුවරු සැකසීම.
- ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ සත්ත්ව නිදර්ශක යාවත්කාලීන කිරීම.
- අස්ථික විද්‍යා මැදිරියට අවශ්‍ය මෝරාගේ බොරු මිනී තල්මසාගේ සහ අඳුන් දිවියාගේ අස්ථි පද්ධති සැකසීම.
- කොළඹ ජාතික කෞතුකාගාරය 2017-02-06 වන දින මහජනයාට විවෘත කිරීමට සමගාමීව ජංගම දුරකථන සඳහා “Sri lankan Museums” ලෙස නව අංගයක් mobile App එකතු කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධීකරණය සහකාර අධ්‍යක්ෂ (සත්ත්ව විද්‍යා) විසින් සිදු කරන ලදී.

## (7). අධ්‍යාපන හා ප්‍රකාශන අංශය.

### (අ). කෞතුකාගාර ජංගම ප්‍රදර්ශන

මෙම වසර තුළදී අධ්‍යාපන හා ප්‍රකාශන අංශය මගින් කෞතුකාගාර ජංගම ප්‍රදර්ශන 16 ක් පවත්වන ලදී.

| දිනය | පැවැත්වූ ස්ථානය |
|---|---|
| • 2016.01.31 - 2016.02.02 | මදීනා ජාතික පාසල |
| • 2016.01.18 - 19 | දරුස්සලාම් මහා විද්‍යාලය |
| • 2016.02.02 - 03 | ශාන්ත තෝමස් විද්‍යාලය |
| • 2016.02.25 - 27 | කළුතර බාලිකා විද්‍යාලය |
| • 2016.03.03 - 05 | අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය |
| • 2016.05.21 - 25 | බුද්ධ රශ්මි වෙසක් උත්සවය, අරලියගහ මන්දිරය |
| • 2016.07.01 - 10 | සෞන්දර්ය විශ්ව විද්‍යාලය |
| • 2016.08.17 - 21 | ශ්‍රී විසුද්ධාරාමය කොස්හේන, බඩල්ගම |
| • 2016.08.21 - 22 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මහරගම |
| • 2016.09.07 - 08 | රුහුණු විජයබා ජාතික පාසල |
| • 2016.09.15 - 19 | දෙබරවැව ජාතික පාසල |
| • 2016.09.29 - 30 | ආරක්ෂක විද්‍යාලය |
| • 2016.10.02 - 06 | ජාතික කලා ප්‍රසාදිනී, අපේ ගම පරිශ්‍රය |
| • 2016.10.21 - 22 | මො/පඤ්ඤානන්ද මහා විද්‍යාලය |
| • 2016.11.04 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බලපිටිය |
| • 2016.10.24 | කැලණිය විශ්ව විද්‍යාලය |

### (ඇ). ප්‍රකාශන කටයුතු

මෙම වසර තුළදී අධ්‍යාපන හා ප්‍රකාශන අංශය මගින් මුද්‍රණය කරන ලද ප්‍රකාශන පහත පරිදි වේ.

- Inspirations of the past (ඇසුරුම සහිත වර්ණ පින්තූරපත් කට්ටල)
- මත්ද්‍රව්‍ය නිවාරණ සතිය වෙනුවෙන් මුද්‍රණය කරන ලද අත් පත්‍රිකාව
- භූ විද්‍යා අත් පත්‍රිකාව
- සූචි පත්‍රිකා
- 2015 ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව හා සංයුක්ත තැටි මුද්‍රණය කිරීම
- Sigiri Gaffity Vol:I,Vol:II මුද්‍රණය සඳහා බාර දීම.

## (8). ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරය

ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරය 2016 වසරේදී බාහිර ආයතන 21 ක් සඳහා කුලියට දෙන ලද අතර එයින් ලද ආදායම රු. 479,000.00 කි.

## (9). ජාතික කෞතුකාගාර පුස්තකාලය

### (අ). අත්කරගැනීම්

මෙම වසර තුළදී ජාතික කෞතුකාගාර පුස්තකාලයට අත්පත් කරගනු ලැබූ ග්‍රන්ථ, සඟරා හා අනෙකුත් ලේඛන ගණන 9265 කි.

### (ආ). පොත් බැඳීම්, සූක්ෂම සේයාපටල ගතකිරීම් හා ඡායා පිටපත්.

මෙම වසර තුළදී පුස්තකාලය මඟින් පාඨකයින් සඳහා ඡායාපිටපත් 8263 ක් නිකුත් කරන ලදී.

### (ඇ). පාඨක සංඛ්‍යාව

මෙම වසර තුළදී ජාතික කෞතුකාගාර පුස්තකාලයේ ස්ථිර සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව 10 කි. සාමාජිකත්වය අළුත් කරගත් සංඛ්‍යාව 04 කි. තාවකාලික සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව 35 කි. සාමාජිකත්වය තාවකාලිකව දීර්ඝ කරගත් සංඛ්‍යාව 02 කි. මෙම වසර තුළදී ජාතික කෞතුකාගාර පුස්තකාලයට පැමිණි මුළු පාඨක සංඛ්‍යාව 3132 කි.

### (ඈ). ආදායම

මෙම වසර තුළදී ජාතික කෞතුකාගාර පුස්තකාලයේ මුළු ආදායම රුඃ 397,221.00 කි.

## (10). ඡායාරූප අංශය.

ඡායාරූප අංශය මගින් මෙම වසරේදී,

- ඡායාරූප ගත කිරීම් - 8752 කි.
- සංයුක්ත තැටිවලට (CD) ඇතුළත් කරන ලද ඡායාරූප සංඛ්‍යාව - 8752කි.
- පුස්තකාල ලේඛනවල ඡායාරූප නිකුත් කිරීම් - 110 කි.
- කෞතුක භාණ්ඩවලට අදාල ඡායාරූප නිකුත්කිරීම් - 710 කි
- දෙපාර්තමේන්තුවේ අංශවලට අදාල ඡායාරූප නිකුත් කිරීම් - 403 කි.

# (11). සංරක්ෂණ අංශය

## (අ). 2016 වසරේ සංරක්ෂණය කරන ලද භාණ්ඩ

### (01). පොත් සංරක්ෂණය

- පොත් 4000 ක් ධූමායනය කිරීම.
- කොඩ් 21 ක් ධූමායනය කිරීම.
- පොත් 26 බැඳීම් කටයුතු  සිදු කිරීම.
- ඉපැරණි ග්‍රන්ථ 11 ක් සංරක්ෂණය කිරීම.

| ග්‍රන්ථයේ නම | පිටු ගණන | පොතේ ප්‍රමාණය |
|---|---|---|
| 1. Ceylon Administration Reports 1889 .Part-I | 450 | 8 1/2" X 12 1/2 " |
| 2.ව්‍යවස්ථා සංග්‍රහය මුලාදෑනීන් විසින්-1874 | 101 | 5 1/2" X 8 1/2" |
| 3.The Kavyasekare | 106 | 6" X 9" |
| 4.The Book of Decorative Furniture | 427 | |
| 5. Ceylon Hansard .Ceylon Legislative Council | 810 | 6.5" X 10" |
| 6.The Buddhist - 1889-1890 | 211 | 10 1/4 " X 6.5" |
| 7.The English Sinhala Dictionary -1891 | 514 | 5.5" X 9" |
| 8.Sinha English Dictionary. | 1120 | 3.5 " X 6" |
| 9.Sinhala Pamphlets | 536 | 4.5" X 5.5 " |
| 10.The Audiences of  Ceylon-1942 | 233 | 10" X 6 1/2" |
| 11.Sinhalese Pamphlets Buddhism | 750 | 5 1/2" X 4 1/2" |

### (02). සංරක්ෂණය කරන ලද භාණ්ඩ

- **මානව වංශ විද්‍යා අංශය**

1. බුදු පිළිම 01
2. ස්ත්‍රී දේව පිළිම 01
3. නටරාජා පිළිම 01

4. හුණු කිල්ලෝට 01

5. නෙළුම් මලක් සහිත ගඩොලක්

6. ප්‍රතිමා රඳවනය

7. මාංචු 03

8. පන්වර්

9. සීනු

10. ඝන මුද්‍රා 03

11. රාජ්‍ය ලාංඡනය

12. සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණය දැක්වෙන චිත්‍රයක්

13. සිතුවම් සහිත ලෑලි 02

14. හිස සහ අත නොමැති හුණුගල් බුදු පිළිමයක්

15. බුදු පිළිමයක හිස කොටස (හුණුගල්)

16. බෝධිසත්ව හිස

17. නන්දිගවයාගේ හිස

18. බෝධිසත්ව ප්‍රතිමාවක කොටසක්

19. බෙහෙත් ඇඹරුම් ගලක්

20. උඩ අළුදෙනියේ සමාධි ප්‍රතිමාව සහ ලී පාදස්තලය } සංරක්ෂණය සඳහා භාර ගැනීම

21. සේරක්කලය

22. කාසි - 144 සංරක්ෂණය කිරීම

- **මානව විද්‍යා අංශය**

1. වංගෙඩිය 02

2. කුරහන්ගල

3. බරණි 02

4. තාලි 02

5. ට්‍රන්කා පෙට්ටිය

6. ලාහ

7. යතුර සමග ඉබ්බා

8. හිරය

- **කීට විද්‍යා අංශය**

  1. ලංකා සිතියම් 01

- **ප්‍රාදේශීය කෞතුකාගාරවල සංරක්ෂණ කටයුතු -**

1. **අනුරාධපුර ගැමි කෞතුකාගාරයේ** භාණ්ඩ 360 ක් සංරක්ෂණය කිරීම.

2. **රත්නපුර ජාතික කෞතුකාගාරයේ** සිතියම් - 15 සහ රෙදිපිළි කොටස්- 15 ක් ඇතුළු භාණ්ඩ 25 ක් සංරක්ෂණය සඳහා සංරක්ෂණ අංශයට රැගෙන ඒම.

3. **මහනුවර ජාතික කෞතුකාගාරයේ** කැප්පෙටිපොල දිසාව කොඩිය ඇතුළු රෙදිපිළි 03 ක් සංරක්ෂණය සංරක්ෂණ අංශයට රැගෙන ඒම.

කෞතුක භාණ්ඩ- 300 ක් සංරක්ෂණය කිරීම.

4. **කොළඹ කෞතුකාගාරය**

- චිත්‍ර මැදිරියේ සංරක්ෂණ කටයුතු
- අළුත්වැඩියා කටයුතු වලින් පසුව තොළුවිල බුද්ධ ප්‍රතිමාව ඇතුළු භාණ්ඩ සංරක්ෂණය කිරීම
- ඇත්දළ පනා 32
- රාජ ලාංඡනය
- වෙහෙරගල බුදුපිළිමය
- වෙන්කත රංගම්මාල් දේවියගේ චිත්‍රය
- සංක්‍රාන්තික යුගයට අයත් චීන කාසි -02

5. **ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ** තුන්පත් රෑන සිතුවම සංරක්ෂණය කිරීම.

**(ඈ). කෞතුකාගාරවල කෘමි හා ශාක මර්දන කටයුතු**

- කොළඹ කෞතුකාගාරය ඇතුළු සියලුම ප්‍රාදේශීය කෞතුකාගාරවල වේයන් මර්දන කටයුතු

- ගොඩනැගිලි මත වර්ධනය වන ශාක මර්දන කටයුතු සිදු කිරීම.
- ආලෝකය සහ ආර්ද්‍රතාව වාර්තා ලබා ගැනීම

**(ඈ). වෙනත් කාර්යයන්**

- පනාගොඩ යුධ හමුදා කඳවුරට අයත් ඉපැරණි කොඩි 2 ක් සංරක්ෂණය කිරීම.
- ගාල්ල රිච්මන් විද්‍යාලයේ නිල කබා 02 ක් සංරක්ෂණය සඳහා භාර ගැනීම.
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරිනියකට අයත් පෞද්ගලික සහතිකපත් 2ක් සංරක්ෂණය කිරීම.

## (12). ප්‍රදර්ශන සැලසුම් අංශය

- භූ විද්‍යා මැදිරියේ නිර්මාණ කටයුතු කිරීම.
- සංරක්ෂණ අංශය සමඟ එක්ව තුන්පත් රෑන සිතුවම සංරක්ෂණයේදී ප්‍රතිනිර්මාණය සඳහා දායක වීම.
- අස්ථික මැදිරියේ නිර්මාණ කටයුතු කිරීම.
- මහනුවර ජාතික කෞතුකාගාරයේ නිර්මාණ කටයුතු කිරීම.

## (13). තොරතුරු තාක්ෂණ අංශය.

තොරතුරු තාක්ෂණ අංශය මගින් මෙම වසරේදී පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු වෙබ් අඩවිය සඳහා නවතම පුවත්, කෞතුකාගාර චාරිකා, ශ්‍රවණාගාරය වෙන්කරවා ගැනීම, කාර්යය මණ්ඩල තොරතුරු, බඳවා ගැනීමේ පටිපාටි ආදිය අවශ්‍ය පරිදි යාවත්කාලීන කිරීම

- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩල තොරතුරු ඇතුලත් දත්ත සංචිතයේ තනතුරු වලට බඳවා ගැනීම්, ස්ථාන මාරුවීම්, උසස්වීම් ආදිය යාවත්කාලීන කිරීම

- ඉහත 2 දත්ත සංචිතයෙන් අවශ්‍ය අවස්ථාවන්හිදී තොරතුරු අදාල පාර්ශවයන්ට ලබාදීම

- සත්ත්ව විද්‍යා අංශයේ පරිත්‍යාග වශයෙන් අත්පත් කරගත් ආදර්ශක 82 ක් ද, මහේස්ත්‍රාත්

අධිකරණවලින් එවන ලද ආදර්ශක 2 ක් ද වශයෙන් ස්වභාවික විද්‍යා අංශයේ ආදර්ශක **84** ක් (2016.01.01.NH සිට 2016.11.01.NH දක්වා) ස්වභාවික විද්‍යා මධ්‍යම අත්පත් කරගැනීමේ ලේඛනයේ ලියාපදිංචිකිරීම

- මානවවංශ විද්‍යා අංශයේ පරිත්‍යාග වශයෙන් අත්පත් කරගත් කෞතුක භාණ්ඩ 29 ක් හා මිලට ගත් එක් කෞතුක භාණ්ඩයක් ද මානව විද්‍යා අංශයේ පරිත්‍යාග වශයෙන් අත්පත් කරගත් කෞතුක භාණ්ඩ 32 ක් ද වශයෙන් කලා අංශයේ කෞතුක භාණ්ඩ **62** ක් (ලියාපදිංචි අංක 2016.1.1 සිට 2016.32.2 දක්වා) කලා අංශයේ මධ්‍යම අත්පත් කරගැනීමේ ලේඛනයේ ලියාපදිංචි කිරීම
- ඉහත 4 හා 5 ට අදාල පරිත්‍යාග සඳහා සහතික පත්‍ර නිකුත් කිරීම

- දෙපාර්තමේන්තු පරිගණක නඩත්තුව හා වෛරස් ආවරණ මෘදුකාංගය සම්බන්ධ කටයුතු කළමනාකරණය කිරීම

## (14). කෞතුකාගාරවල කටයුතු:

### (අ). කොළඹ ජාතික කෞතුකාගාරය.

වර්ෂ 1877 දී මහජන ප්‍රදර්ශනයට විවෘත වූ කොළඹ කෞතුකාගාරයේ ඉදිරිපස කොටසේ සංරක්ෂණ කටයුතු සහ ප්‍රතිසංස්කරණ කටයුතු මෙම වසරේ දී ද සිදු කරගෙන යන ලදී. මීට අමතරව ප්‍රාග් ඓතිහාසික යුග, අනුරාධපුර යුග,කලා ශිල්ප, අවි ආයුධ , මිල මුදල් හා ධජ පතාක යන මැදිරිවල ප්‍රදර්ශන නැවත සැලසුම් කිරීමත්, සිතුවම් මැදිරියේ හා වහලයේ අලුත්වැඩියා කටයුතු සිදුකිරීමත් සිදු කරන ලදී. එසේම විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සඳහා ඉතිහාසය සම්බන්ධ දේශන පහක් ද, පාසල් ගුරුවරුන් සඳහා එක් දේශනයක් ද, පාසැල් සිසුන් සඳහා එක් දේශනයක් ද, පාසැල් පහක් සඳහා මාර්ගෝපදේශන සේවා සිදුකරන ලදී.

එසේම කෞතුකාගාරය සඳහා CCTV පද්ධතියක් ස්ථාපිත කිරීම සිදු කරන ලදී.

### (ආ). ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය.

ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය මගින් මෙම වසරේදී අධ්‍යාපනික දේශන 6 ක් පවත්වන ලද අතර විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගේ පර්යේෂණ නිබන්ධන දෙකක් සඳහා තොරතුරු ලබාදීම ද සිදු කරන ලදී. මේ වසරේ ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ අලුත්වැඩියා කටයුතු කිහිපයක් සිදු කරන ලදී. එනම් කෞතුකාගාරයේ බිම් මහලේ දකුණුපස හා වම්පස දිරා ගිය ජනේල් ඉවත් කර ඇලුමිනියම් ජනේල් යෙදීම , කෞතුකාගාරයේ හදිසි පිටවීම් දොරටු සඳහා ඉහළ මහලයේ සිට පඩිපේලි දෙකක් ඉදිකිරීම හා කෞතුකාගාරයේ ආරක්ෂාව සඳහා යකඩ දොරවල් ඉදි කිරීම වේ.

## (ඇ). මහනුවර ජාතික කෞතුකාගාරය.

මහනුවර ජාතික කෞතුකාගාරයේ සංරක්ෂණාමය අලුත්වැඩියා කටයුතු හේතුවෙන් මෙම වසරේදී ද මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත නොකරන ලදී.

ඒ අනුව කෞතුකාගාර ප්‍රතිසංස්කරණ හා සංරක්ෂණය යටතේ මේ වසරේ දී කෞතුකාගාර වහලයේ දිරාපත් වූ දැව ඉවත් කර නව දැව යෙදීම, නව උළු සෙවිලි කිරීම හා දැව සිවිලිමක් යෙදීම, වහලයේ දිරාපත්ව තිබූ කොත් හා වඩිම්බු වෙනුවට අළුතින් කොත් හා වඩිම්බු යෙදීම ආදිය සිදු කරන ලදී.

එමෙන්ම ගොඩනැගිල්ලේ බිත්ති සැකසීමත්, බිම් සැකසීමත්, වටපිල සකස් කිරීමත්, කානු පද්ධතිය සැකසීමත්, තාප්පය සැකසීමත් සිදු කරන ලදී.

කෞතුකාගාරයට අයත් විශාල වශයෙන් හායනයට ලක් වෙමින් පවතින කෞතුක භාණ්ඩ සංරක්ෂණයත්, ස්ථිර ප්‍රදර්ශනය කටයුතු සැලසුම් කිරීමත්, ප්‍රදර්ශන අල්මාරි සැකසීම, ප්‍රදර්ශන මැදිරි පසුතල නිර්මාණය, පාදස්තල සකස් කිරීම, ලේබල් සැකසීම ආදිය ද ආරම්භ කරන ලදී.

## (ඈ). ඕලන්ද කෞතුකාගාරය

ඕලන්ද කෞතුකාගාරය මගින් මෙම වසරේදී කෞතුකාගාරය නැරඹීමට පැමිණි විශ්ව විද්‍යාල සිසුන් සඳහා කෞතුකාගාරය පිළිබඳ හැඳින්වීමේ දේශන දෙකක්ද, එක් සම්මන්ත්‍රණයක් හා එක් වැඩමුළුවක් පවත්වා ඇත.

කෞතුකාගාරයේ පිටුපස ඇති තනි මහලේ ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කරන ලදී.

මීට අමතරව වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය මගින් 2016.12.15 දින කෞතුකාගාරයේ පටිගත කිරීමක් සිදු කරන ලදී.

## (ඉ). රත්නපුර ජාතික කෞතුකාගාරය.

රත්නපුර ජාතික කෞතුකාගාරය මගින් මෙම වසරේදී කෞතුකාගාරය නැරඹීමට පැමිණි විශ්ව විද්‍යාල සිසුන් දහ දෙනෙකුගේ ව්‍යාපෘති සඳහා කෞතුකාගාරය පිළිබඳ තොරතුරු ලබා දීමත්, පාසැල් සිසුන් සඳහා "ශ්‍රී ලංකාවේ වාරි තාක්ෂණය "නමින් එක් සම්මන්ත්‍රණයක් හා පොත් අළෙවි සැළක් පවත්වා ඇත.

රත්නපුර ජාතික කෞතුකාගාරයේ සංස්කෘතික මධ්‍යස්ථානය නමින් හඳුන්වන ගොඩනැගිල්ලේ වැඩ නිම කිරීම, කෞතුකාගාර ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු හා නව වැසිකිලි පද්ධතිය ඉදි කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

## (ඊ). අනුරාධපුර ජන කෞතුකාගාරය.

අනුරාධපුර ජන කෞතුකාගාරය මගින් මෙම වසරේදී කෞතුකාගාරය නැරඹීමට පැමිණි පාසල් සිසුන් සඳහා නුවර කලාවියේ ගැමි ජීවිත පිළිබඳ හැඳින්වීමේ දේශන දහයක්ද, රජරට විශ්ව විද්‍යාලයේ සිසුන් කණ්ඩායම් 5 ක් සඳහා එක් දිනක විශේෂ වැඩසටහනක්ද, රජරට විශ්ව විද්‍යාලයේ සිසුන් කණ්ඩායමක් සඳහා කෞතුකාගාරයේ කටයුතු පිළිබඳ දින 30 ක පුහුණුවක් ද ලබා දී ඇත.

## (උ). ගාල්ල ජාතික කෞතුකාගාරය.

පාසැල් හා විශ්වවිද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති සදහා තොරතුරු ලබාදීම සිදුකරන ලදී.

කෞතුකාගාර කාර්යාල කාමරයේ ඉදිකිරීම් කටයුතු හා කෞතුකාගාර ගොඩනැගිල්ලේ වහලයේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීම හා ගාල්ල ජාතික කෞතුකාගාර ගොඩනැගිල්ලේ ඇතුළත හා පිටත බිත්තිවල තීන්ත ආලේප කිරීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරා දී ඇත. එමෙන්ම කෞතුකාගාරයේ කෞතුක භාණ්ඩ සංරක්ෂණය කටයුතු සිදු කර ප්‍රදර්ශන කටයුතු ක්‍රමවත් කර කෞතුකාගාරය විවෘත කිරීමේ කටයුතු සිදු කිරීමට නියමිතය.

## (ඌ). ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය.

ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය මඟින් පාසැල් කණ්ඩායම් හා නරඹන්නන් සඳහා දේශන හැඳින්වීම් ඉදිරිපත් කිරීම හා පාසැල් සිසුන්ගේ හා විශ්ව විද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති සඳහා, අවශ්‍ය තොරතුරු ලබා දීම සිදුකරන ලදී.

## (එ). නිදහස් අනුස්මරණ කෞතුකාගාරය.

නිදහස් අනුස්මරණ කෞතුකාගාරය මගින් මේ වසරේ දී කෞතුකාගාරය නැරඹීමට පැමිණි පාසැල් කණ්ඩායම් 19 ක් සඳහා කෞතුකාගාරය පිළිබඳ හැඳින්වීමේ දේශන පවත්වන ලදී.මෙයට අමතරව පාසැල් සිසුන් හා විශ්වවිද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති සදහා අවශ්‍ය තොරතුරු ලබා දීම ද සිදු කරන ලදී, රජයේ චිත්‍රපට අංශය මගින් ඩී.එස් අනුස්මරණ රූපවාහානී වැඩසටහනට හා සිරස රූපවාහිනී මාධ්‍ය මගින් මගින් chooty tv වැඩසටහන සඳහා ද කෞතුකාගාරයේ පටිගත කිරීම් සිදු කර ඇත.Ceylon Today පුවත්පතේ පළ කිරීම සඳහා කෞතුකාගාරය පිළිබඳ තොරතුරු ලබා දෙන ලදි.

කෞතුකාගාරය තුළට පිරිසිදු වාතාශ්‍රය ලබා ගන්නා උපකරණ කට්ටලයක් නවීකරණය කොට සවි කිරීම,කෞතුකාගාර Wash Room එකට අයත් ජල මොටරය සහ පිවිසුම් මාර්ග ටයිල් අල්ලා සකස් කිරීම සහ නිදහස් අනුස්මරණ කෞතුකාගාරය යනුවෙන් නව නාම පුවරු 4 ක් සවි කිරීම සිදු කරන ලදී.

## (ඒ). මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය.

මෙවර ජාත්‍යන්තර කෞතුකාගාර දින වැඩසටහන පවත්වන ලද්දේ මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරයේ ය.

මේ වසරේ දී තුළ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වැඩ ආරම්භ කරන ලදී.

## (15). 2016 වසරේ ආදායම

| කෞතුකාගාරයේ නම | ප්‍රවේශපත්‍ර | ප්‍රකාශන | කැමරා බලපත්‍ර | ගොඩනැගිලි කුළිය | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| කොළඹ ජාතික කෞතුකාගාරය | 30,636,690.00 | 869,825.00 | 1,540,750.00 | 576,047.00 | 58,810.00 | **33682122.00** |
| ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය | 4,002,045.00 | 1,140.00 | 75,000.00 | - | 201,425.00 | **4,279,610.00** |
| ජාතික කෞතුකාගාර පුස්තකාලය | - | - | - | | 398,421.00 | 398,421.00 |
| ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරය | - | - | - | 479,000.00 | - | 479,000.00 |
| ඕලන්ද කෞතුකාගාරය | 2,113,280.00 | 11,302.00 | 104,731.00 | - | - | **2,229,313.00** |
| මහනුවර ජාතික කෞතුකාගාරය | **සංරක්ෂණ නවීකරණ කටයුතු සඳහා තාවකාලිකව වසා ඇත.** | | | | | |
| ගාල්ල ජාතික කෞතුකාගාරය | 59,090.00 | 15,229.00 | 1,250.00 | - | - | **75,569.00** |
| රත්නපුර ජාතික කෞතුකාගාරය | 387,005.00 | 172,870.00 | 28,250.00 | - | - | **588,125.00** |
| ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය | 1,256,325.00 | 6,570.00 | 55,500.00 | - | - | **1,318,395.00** |
| අනුරාධපුර ජන කෞතුකාගාරය | 144,470.00 | 47,144.00 | 1,750.00 | - | - | **193,364.00** |
| නිදහස් අනුස්මරණ කෞතුකාගාරය | 349,695.00 | 20,000.00 | 14,000.00 | - | - | **383,695.00** |
| මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය | 47,175.00 | 21,470.00 | - | - | - | **68,645.00** |
| **එකතුව** | **38,995,775.00** | **1,165,550.00** | **1,821,231.00** | **1,055,047.00** | **658656.00** | **43,696,259.00** |

## 2016 වසරේ ආදායම, 2015 වසරේ ආදායම සමග සංසන්දනය කිරීම.

| වර්ෂය | ප්‍රවේශපත්‍ර | ප්‍රකාශන | කැමරා බලපත්‍ර | ගොඩනැගිලි කුළිය | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2016 | 38,995,775.00 | 1,165,550.00 | 1,821,231.00 | 1,055,047.00 | 658656.00 | 43,696,259.00 |
| 2015 | 32,651,200.00 | 1,046,651.00 | 1,788,950.00 | 1,177,329.94 | 448,568.00 | 37,112,698.94 |

2016 වර්ෂයේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මුළු ආදායම රු. 43,696,259.00 ක් වන අතර, 2015

වර්ෂයේ සමස්ත ආදායම රු. 37,112,698.94 ක් වේ.




**ප්‍රස්ථාර අංක 01 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ වාර්ෂික ආදායම**

සනුජා කස්තුරිආරච්චි.

ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ (වැ.බ)

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,

කොළඹ- 07.

**දකුණු කොරියාවේ සංස්කෘතික උරුම ජාතික පර්යේෂණ ආයතනය සමග සිදුකළ කෞතුක භාණ්ඩ සංරක්ෂණ වැඩමුළුව.**






ජාත්‍යන්තර කෞතුකාගාර දින සැමරුම.








**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ජංගම දුරකථන යෙදවුම සඳහා 2016 වසරේ ලද සම්මාන.**




ස්වාභිමානි 2016 - ජාතික හොඳම ඉ කාණ්ඩය යටතේ වන සම්මානය.




m Billion$^{th}$ - 2016 සම්මානය.

## කොළඹ ජාතික කෞතුකාගාරයේ සංරක්ෂණ අලුත්වැඩියාව - 2016









NATIONAL MUSEUM

COLOMBO


**53, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව**
**දුරකථන - ප්‍රධාන කාර්යාලය 011 - 2694767, ෆැක්ස් - 011 - 2692092**
**ඊමේල් - nmdep@slt.lk, වෙබ් -www.museum.gov.lk**

53, சேர் மார்கஸ் பெர்னாந்து மாவத்தை, கொழும்பு 07, இலங்கை.
தொலைபேசி - பிரதான அலுவலகம்: 011-2694767
பெக்ஸ்: 011-2692092, மின்னஞ்சல்: **nmdep@slt.lk**, இணையம் -**www.museum.gov.lk**

53, Sir Marcus Fernando Mawatha, Colombo 07, Sri Lanka
Tel - General Office 011 - 2694767, Fax - 011 - 2692092
E-mail - **nmdep@slt.lk**, Web - **www.museum.gov.lk**